ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ
අංක 1966/3 - 2016 මැයි මස 09 වැනි සඳුදා - 2016.05.09
(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/10/14/2011

### කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය

අංක 1952/40 දරන හා 2016.02.03 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශ්වයක් වශයෙන් ගම්පහ, ශ්‍රී බෝධි පාර, අංක 88/20හි පදිංචි ඒ. ගමගේ මහතා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 01, ලංකා බැංකු මාවත, අංක 04හි පිහිටි ලංකා බැංකුව අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A3509 දරන හා 2015.12.23 වැනි දිනැති ප්‍රදනය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් ඒ. ගමගේ මහතා වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A3509 දරන බේරුම්කාර ප්‍රදනය ක්‍රියාත්මක වීම 2017.02.02 වැනි දින සිට අවසන් වන බවට පනතේ 20(2)(ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2016 මැයි මස 04 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

''අ'' ආකෘති පත්‍රය

(3 වන නියෝගය)

### 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනත
### බේරුම්කරුවෙකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම

ලිපිනය : ඒ. ගමගේ,
අංක 88/20, ශ්‍රී බෝධි මාවත,
ගම්පහ.

(පළමු පාර්ශවය)
දිනය : 2016 අප්‍රේල් මස 26 වැනි දින.

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතට යි.

2016.02.03 දිනැති අංක 1952/40 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද්දවූ ද ඒ. ගමගේ මයා සහ ලංකා බැංකුව බැඳී සිටින්නාවූ ද 2015.12.23 වැනි දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒ ගමගේ,
පළමු පාර්ශවකරු.

පිටපත් :
1. කම්කරු කොමසාරිස්තුමා,
කාර්මික සම්බන්ධතා අංශය,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

05-701


මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

මගේ අංකය : IR/15/14/2012

**කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය**

131 වැනි අධිකාරය වැනි සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2014.03.17 දිනැති හා අංක 1854/4 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2014.02.24 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් කොටදෙනියාව, රවුම් පාර, ''සිසිර වාස'' හි පදිංචි යූ. ආර්. කේ. එන්. විජේතුංග මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 10, ටී. බී. ජායා මාවත, අංක 500හි පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය අතර පවත්නා කාර්මික ආරවුල බේරුම්කිරිමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2016.03.01 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2016 මැයි මස 04 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

යොමු අංකය : IR/15/14/2012

**කාර්මික අධිකරණයේ දී ය**

යූ, ආර්. කේ. එන්. විජේතුංග මයා,
''සිසිර වාස'',
රවුම් පාර,
කොටදෙනියාව,

-ඉල්ලුම්කරු-

නඩු අංකය : A/3542

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
අංක 500,
ටී. බී. ජායා මාවත,
කොළඹ 10.

-වගඋත්තකරු-

**ප්‍රදානය**

1. කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණි ලොකුගේ මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62, 1962 අංක 04 හා 1968 අංක 39(1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වැනි කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් ඇමතිතුමා සතු බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ඔහුගේ 2014.02.24 දිනැති නියෝගයෙන් මා පත්කොට ඇත.

2. ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ 1985.06.03 වැනි දින සිට එවකට පැවැති මහවැලි ඉංජිනේරු සහ නිර්මාණ ඒජන්සියේ ලිපිකරුවන් හා සමාන්තර ශ්‍රේණිවලට බඳවාගත් සුදුසුකම් මතම බඳවා ගනු ලැබූ ශ්‍රේණියේ II ගුවන් විදුලි යන්ත්‍ර ක්‍රියාකරු තනතුරේ සේවය කර ඇති යූ. ආර්. කේ. එන්. විජේතුංග මහතාට ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් 2006.01.01 දිනෙන් නියමිත ශ්‍රේණිය හා වැටුප් කාණ්ඩයන්හි තබා නොතිබීමෙන් ඔහුට යම් අසාධාරණයක් සිදුවී ඇත් ද ? එසේ සිදුවී ඇත්නම් ඔහුට හිමිවිය යුතු සහනයන් මොනවා ද යන්න පිලිබඳව වේ.

3. කම්කරු කොමසාරිස්ගේ යොමුවෙ සඳහන් ආරවුලට අදලව පාර්ශවයන්ගෙන් ප්‍රකාශ සහ ප්‍රතිප්‍රකාශ සහ මූලික ලිපි ලේඛන ලබා ගැනීමෙන් අනතුරුව 2014.10.27 වැනි දින පාර්ශවයන් සහ ඔවුන්ගේ නියෝජිතයන් බේරුම්කරණය ඉදිරියට කැඳවන ලදී. එදින මෙම ප්‍රශ්නය සාමකාමී ලෙස බේරුම්කර ගැනීමට ඔවුන්ට අවස්ථාවක් ලබාදෙමින් විභාගය 2014.11.20 දින පස්වරු 2.00ට කැදවන ලදී. එදින ද මෙම ප්‍රශ්නය සාමකාමී ලෙස බේරුම්කර ගැනීමට පාර්ශවයන් අසමත්වී ඇති බැවින් ප්‍රථමයෙන් සාක්ෂි මෙහෙයවන ලෙස පැමිණිලිකාර පාර්ශ්වයට මා විසින් දැනුම් දෙනු ලදී. එදින ඉල්ලුම්කාර උතුමංගේ රේණුක කුමාර නිමල් විජේතුංගගේ සාක්ෂි මෙහෙයවීම ආරම්භ කරන ලදී.

4. පැමිණිල්ල විසින් මෙම නඩුවේ ප්‍රථමයෙන් සාක්ෂි දීම ආරම්භ කර ඇති අතර පැමිණිලිකරු උතුමංගේ රේණුක කුමාර නිමල් විජේතුංග 2014.11.20 දින ඔහුගේ සාක්ෂිය ආරම්භ කොට මූලික සාක්ෂිය සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශ්වයෙන් හරස් ප්‍රශ්න විමසීම අවසන් කර පැමිණිලිකරුගෙන් නැවත විමසීම් කිරිමෙන් පසු එම සාක්ෂිය 2015.05.05 දින අවසන් කරන ලදී.

වගඋත්තරකාර පාර්ශ්වය වන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙනුවෙන් එහි පරිපාලන නිලධාරී ඒ. එම්. ඩී. අශෝක කුමාර මහතාගේ සාක්ෂිය 2015.07.23 වන දින ආරම්භ කරන ලදී. හරස් ප්‍රශ්න සහ නැවත ප්‍රකාශ වලින් අනතුරුව 2015.12.23 වැනි දින අවසන් කරන ලදී.

5. මෙම පරීක්ෂණයේ දී දෙපාර්ශ්වයෙන්ම එක් සාක්ෂිකරුවකු බැගින් සාක්ෂි දී ඇතත් දෙපාර්ශ්වයෙන් විශාල සංඛ්‍යාවක් ලිපිලේඛන ගොනු කර ඇත. ඉල්ලුම්කරු වෙනුවෙන් ඒ1 සිට ඒ29 දක්වා වූ ලිපි ලේඛන ගොනු කර ඉදිරිපත් කොට ඇති අතර වගඋත්තරකාර පාර්ශ්වයන් ආර්1 සිට ආර්10 වශයෙන් ලිපි ලේඛන ගොනු කර ඇත.

දෙපාර්ශ්වයෙන්ම ඉත සඳහන් පරිදි සැහෙන සංඛ්‍යාවක් ලිපි ලේඛන ඉදිරිපත් කර ඇතත් පහත සඳහන් ලේඛන ඉල්ලුම්කරුගේ ඉල්ලීමට බාධා ගෙන දී ඇත.

(R3 හි 1 වැනි ඡේදය මැද කොටස)

භාණ්ඩාගාරයේ ලේකම් සහ මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කර ඇති 2006.09.22 දිනැති අංක 30 දරන සේවා චක්‍රලේඛයේ මෙසේ සඳහන් වේ.

''ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සේවකයින්ගේ වැටුප් සහ සේවක සංඛ්‍යාව කොමිෂන් සභාවේ නිර්දේශවලට අනුකූලව සංශෝධනය කිරීමට තීරණය කර ඇත.'' (R3 හි 1 වැනි ඡේදයේ මැද කොටස)

ඉහත වැටුප් සංශෝධන අදාල වන නමුත් ඇමුණුම් III ට ඇතුළත් නොවූ කිසියම් ආයතනයක් වේ නම් එම ආයතනය සිය වැටුප් සංශෝධනය පිළිබඳව ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවෙන් විමසිය යුතු ය.

''මෙම නව වැටුප් පරිවර්තනය සම්බන්ධයෙන් තවදුරටත් පැහැදිලිකර ගැනීම් විස්තර විමසීම් හෝ වැඩිදුර උපදෙස් සඳහා වන සියලුම ඉල්ලීම් කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පිහිටි ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ ලේකම් වෙත යොමු කළ යුතු බව'' ද 8 වැනි ඡේදයේ සඳහන් වේ.

6. ඉහත සඳහන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම් ජී. බී. ජයසුන්දර මහතාගේ R3 චක්‍රලේඛයෙන් පසු ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ විසින් ඉහත චක්‍රලේඛ අනුව මහවැලි අධිකාරියේ ක්‍රියාකළ යුතු ආකාරය අනුමත කොට සවිස්තරාත්මක ලිපියක් කෘෂිකර්ම, වාරිමාර්ග හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙත යවා ඇති අතර R3 එම ලිපියේ පිටපත් විගණකාධිපති අධ්‍යක්ෂ ජනරාල් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යවා ඇති අතර ඉල්ලුම්කරුට අදාල වන පරිවර්තක වැටුප් PL2 ගණයට වැටෙන බව ද ඉල්ලුම්කරු එම පරිවර්තක වැටුප් ලබා ගැනීම කිසිදු අවස්ථාවක ප්‍රතික්ෂේප කර නැති බව ද වගඋත්තරකාර ආයතනයේ නීතිඥ රම්‍යා රාජපක්ෂ මහත්මියගේ ලිඛිත දේශනයේ 3 වැනි පිටුවේ පැහැදිලි කර ඇත. පැමිණිල්ලෙන් මීට පැහැදිලි පිළිතුරක් ඉදිරිපත් කර නැත.

7. ඉල්ලුම්කාර පාර්ශ්වයේ නියෝජිත පිටු 21 ක යතුරු ලියනය කරන ලද ලිඛිත දේශනයක් ඉදිරිපත් කර ඇතත් රජයේ භාණ්ඩාගාරයේ මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා චක්‍රලේඛ සහ මහවැලි අධිකාරියේ චක්‍රලේඛ වලට පටහැනිව ඉල්ලුම්කරුට ඔහු ඉල්ලා සිටින සහනය ලබාදුන් හොත් අවුල් ජාලයකට පරිපාලන සහ රාජ්‍ය මූල්‍ය සම්ප්‍රදය බිඳ වැටීමට ඉඩ ඇත. ඉල්ලුම්කාර පාර්ශ්වයේ නියෝජිතවරයාගේ ලිඛිත දේශනයේ ඇති වෙනත් කරුණු මුදල් අමාත්‍යාංශය මහා භාණ්ඩාගාර සේවා චක්‍රලේඛ සේම මහවැලි අධිකාරියේ සම්ප්‍රදායන්ට පටහැනි බැවින් ඉල්ලුම්කරු ඉල්ලා සිටින සහනයන් ලබා දීමට බේරුම්කරණයට හැකියාවක් නැත.

ඉල්ලුම්කාර පාර්ශ්වයේ නියෝජිත තැන විසින් පිටු (21) කින් යුත් ලිඛිත දේශනයක් ඉදිරිපත් කර ඇතත් ඉල්ලුම්කරුගේ ඉල්ලීමට ඉඩදුනහොත් පැන නගින නීතිමය ගැටළු සහ මහාභාණ්ඩාගාරය සහ විශේෂයෙන් කළමනාකාර සේවයේ අංක 30 දරන චක්‍රලේඛයේ සඳහන් කරුණු ගැන අවධානය යොමු නොකිරීම කණගාටුවට හේතුවකි.

ඉල්ලුම්කාර පාර්ශවයේ ලිඛිත දේශනය පිටු 21කින් සමන්විත වුව ද ඉල්ලුම්කරුගේ ඉල්ලීම ඉටු කළහොත් පැන නගින නීතිමය ප්‍රශ්න සහ සමස්තයක් වශයෙන් ඇති වන මූල්‍යමය ප්‍රශ්න කෙරෙහි ද ඉල්ලුම්කරුගේ නියෝජිතවරයාගේ අවධානයට ලක්ව නැති බව පෙනේ.

8. කරුණු මෙසේ හෙයින් කම්කරු කොමසාරිස්වරයාගේ 2014.01.13 දිනැති යොමුව අදාලව ''1985.06.03 වැනි දින සිට එවකට පැවති මහවැලි ඉංජිනේරු හා නිර්මාණ ඒජන්සියේ ලිපිකරුවන් හා සමාන්තර ශ්‍රේණිවලට බඳවා ගත් සුදුසුකම් මතම බඳවා ගනු ලැබූ II ශ්‍රේණියේ ගුවන්විදුලි යන්ත්‍ර ක්‍රියාකරු තනතුරේ සේවය කර ඇති යූ. ආර්. කේ. එන්. විජේතුංග මහතාට ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් 2016.01.01 දිනෙන් නියමිත ශ්‍රේණිය හා වැටුප් කාණ්ඩයන්හි තබා නොතිබීමෙන් මෙම සේවකයාට අසාධාරණයක් සිදු වී නැති බැව් මගේ නිගමනය වේ. එබැවින් ඔහුට සහනයන් ලබා දීමට අවශ්‍යතාවයක් නැති බව ද මම නිගමනය කරමි.''

මෙම තීරණය සාධාරණ හා යුක්ති සහගත බව මම සලකමි.

නීතිඥ ටී. පියසෝම,
බේරුම්කරු.

2016 මාර්තු මස 01 වැනි දින.

05-702

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.